# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2303/05 - 2022 ඔක්තෝබර් මස 25 වැනි අඟහරුවාදා - 2022.10.25

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2017 අංක 24 දරන දේශීය ආදායම් පනත**

66 වන වගන්තියේ (2) සහ (3) වන උපවගන්ති යටතේ නිවේදනය

2021 අංක 10 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත මගින් සංශෝධනය කර ඇති පරිදි 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 66 වන වගන්තියේ (2) සහ (3) වන උපවගන්ති යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව දොන් රංජිත් සිසිරකුමාර හපුආරච්චි වන මම මෙම නිවේදනය මගින් බැංකු ව්‍යාපාරයක් මගින් වන ලැබීම් සහ ලාභ ගණනය කිරීමේ දී, තැනැත්තකු විසින් ණය හිමිකමක් සඳහා විශේෂ ප්‍රතිපාදන සලසනු ලබන අවස්ථාවක දී එම ප්‍රතිපාදන කෙතරම් දුරකට අඩු කළ යුතුදැයි මෙහි 1 වන උපලේඛනයෙහි සහ එවැනි තැනැත්තෙකු විසින් එකී ප්‍රතිපාදන සම්බන්ධයෙන් පිළියෙල කර රඳවා ගත යුතු වාර්තා ආකෘති පිළිබඳ මෙහි 2 වන උපලේඛනයෙහි නිශ්චිතව දක්වමි.

මෙම නිශ්චය කිරීම් 2022 අප්‍රේල් මස 1 වැනි දින සිට ක්‍රියාත්මක වන අතර, එදින සිට බලපැවැත්වෙන පරිදි, 2018 අප්‍රේල් මස 1 වැනි දින අංක 2064/57 දරන *අතිවිශෙෂ ගැසට්* නිවේදනය මගින් ප්‍රකාශයට පත් කළ නිශ්චය කිරීම් පරිච්ඡින්න කරනු ලැබේ.

දොන් රංජිත් සිසිරකුමාර හපුආරච්චි,
දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්.

2022 ඔක්තෝබර් මස 21 වැනි දින දී ය,
කොළඹ.



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## 1 වන උපලේඛනය

1. පහත සඳහන් ණය හිමිකම් සම්බන්ධයෙන් කිසිදු විශේෂ ප්‍රතිපාදනයක් අඩු නොකළ යුතු ය.

(අ) මුල්‍ය ආයතනයක් විසින් පවත්වාගෙන යන උකස් ගන්නා ව්‍යාපාරයක උකස් ණය ගැතියෙකුගේ ණය හිමිකමක්
(ආ) ආශ්‍රිතයෙකුට හෝ ආශ්‍රිත තැනැත්තෙකුට ලබාදී ඇති ණය හිමිකමක්
(ඇ) ශ්‍රී ලංකාවෙන් බැහැරව වාසය කරන තැනැත්තෙකුට ලබාදී ඇති ණය හිමිකමක්
(ඈ) අදාළ මුල්‍ය ආයතනයේ සේවා නියුක්තිකයෙකුට ලබාදී ඇති ණය හිමිකමක්
(ඉ) යම් ණය ගැතියෙකුට මුල්‍ය ආයතනයක් විසින් බහු ණය පහසුකම් ප්‍රදානය කර ඇති අවස්ථාවකදී සහ විශේෂ ප්‍රතිපාදන වෙන් කරන දිනයට දින අනුවකට පෙර වූ කාලය ඇතුළත එම යම් ණය පහසුකමක් සම්බන්ධයෙන් එම ණය ගැතියා විසින් යම් ගෙවීමක් සිදුකර ඇත්නම්, එම ණය ගැතියාට ප්‍රදානය කර ඇති ණය හිමිකමක්

2. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (SLFRS 9) අනුව වෙන් කරන ලද 1 වන සහ 2 වන අදියර යටතේ වන ණය පහසුකම් සඳහා වන හානිකරන ගාස්තු අඩු නොකළ යුතු ය.

## 2 වන උපලේඛනය

මුල්‍ය ආයතනයක් විසින් ණය හිමිකම් සඳහා සිදු කරන විශේෂ ප්‍රතිපාදනවල වාර්තාවක් පවත්වාගෙන යායුතු ආකෘතිය (1,2 සහ 3 වන අදියර ණය පහසුකම් සඳහා වෙන වෙනම)

| ණය අංකය | ණයගැතියාගේ නම | ණය පහසුකම වර්ගය | මුළු ණය ප්‍රාග්ධනය | මුළු පොලිය | තක්සේරු වර්ෂය ආරම්භයේ දී ණය ප්‍රාග්ධන ශේෂය | තක්සේරු වර්ෂය ආරම්භයේ දී පොලී ශේෂය | වර්ෂය ආරම්භයේ ණය ප්‍රාග්ධන හානිකරන වෙන් කිරීම් ශේෂය | වර්ෂය ආරම්භයේ පොලී හානිකරන වෙන් කිරීම් ශේෂය | වර්ෂය සඳහා ණය ප්‍රාග්ධන හානිකරන වෙන් කිරීම් ප්‍රතිපාදන | වර්ෂය සඳහා පොලී හානිකරන වෙන් කිරීම් ප්‍රතිපාදන | වර්ෂය තුළ අය කිරීම් | වෙනත් යම් ගැළපුම් | වර්ෂය අවසානයේ ණය ප්‍රාග්ධන හානිකරන වෙන් කිරීම් ශේෂය | වර්ෂය අවසානයේ පොලී හානිකරන වෙන් කිරීම් ශේෂය | තක්සේරු වර්ෂය අවසානයේ ණය ප්‍රාග්ධන ශේෂය | තක්සේරු වර්ෂය අවසානයේ පොලී ශේෂය |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | |

EOG 10-0216